ඉල්ලුම් පත්‍රය - (සෙ.මී. 30 x සෙ.මී.20)

එක් විෂයයක් සඳහා එක් ඉල්ලුම් පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ යුතු ය.

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018**

**ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් පත්‍රය**

01. (i)

| නැවත සමීක්ෂණය කළයුතු විෂය අංකය හා විෂයය | | අනුක්‍රමික අංකය (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි) | විභාග අංකය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ii) ලැබූ ශ්‍රේණිය : ☐ (iii) මාධ්‍යය : ☐

02. (i) ඉල්ලුම්කරුගේ නම : පූජ්‍ය ..........................................................................................හිමි/ මයා/ මිය/ මෙනෙවිය
(මුලකුරු සමඟ)

(ii) පෞද්ගලික ලිපිනය : ..........................................................................................................

(iii) ජා.හැ.අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐ (iv) දු.අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

03. ඔබ පාසල් අයදුම්කරුවෙක් ද? ඔව් ☐ නැත ☐

04. විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම : ..........................................................................

05. රු. 250/- (රුපියල් දෙසීය පනහ) ගෙවූ කුවිතාන්සියේ විස්තර :

(i) කුවිතාන්සි අංකය : .................................. (ii) දිනය : ...................................

(iii) තැපල්/ උප තැපැල් කාර්යාලය : ..........................................................................

06. තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ මුල් පිටපත නොගැළවෙන පරිදි, මෙහි පසු පිටෙහි අලවන්න. එහි ඡායා පිටපතක් ඔබ ළඟ තබාගන්න. කුවිතාන්සියේ මුල් පිටපත අලවා නොමැති ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්කරුගේ ප්‍රකාශය :
මා විසින් සපයා ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. යම් අසත්‍ය තොරතුරක් සපයා තිබේ නම්, මෙම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබීමට ද, නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන වෙනසකදී z ලකුණේ සහ ලැබූ ශ්‍රේණියේ වැඩිවීමක් හෝ අඩුවීමක් භාර ගැනීමට ද, නැවත සමීක්ෂණය පිළිබඳ නීතිරීතිවලින් බැඳී සිටීමට ද එකඟ වන බව ප්‍රකාශ කරමි.

දිනය : .......................................... .............................................

අයදුම්කරුගේ අත්සන

08. පාසල් අයදුම්කරුවන් සඳහා විදුහල්පතිගේ සහතිකය :
ඉහත සඳහන් අයදුම්කරු මාගේ විදුහලේ ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක බවත්, මෙහි සඳහන් විභාග අංකය. විභාග මධ්‍යස්ථානයේ නම, විෂයය හා විෂය අංකය, මාධ්‍යය හා ලැබූ ශ්‍රේණිය ප්‍රතිඵල ලේඛනය අනුව නිවැරදි බවත්, මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත මෙම අයදුම්පතේ පසුපිටෙහි අලවා ඇති බවත් සහතික කරමි.

විදුහලේ නම සහ ලිපිනය : ...................................

දිනය : විදුහල්පතිගේ අත්සන

නිල මුද්‍රාව :

**සැ.යු. 1. පෞද්ගලික අයදුම්කරුවන් 01 සිට 07 දක්වා තොරතුරු පමණක් සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් ය.**

**2. ඉල්ලුම් පත්‍ර විභාග කොමසාරිස් ජනරාල්. ඇගයීම් (පාසල් විභාග) ශාඛාව, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන්න.**

**රජයේ දැන්වීමයි**

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018**

**ප්‍රතිඵල නැවත සමීක්ෂණය**

උක්ත විභාගයේ ප්‍රතිඵල විදුහල්පතිවරුන් හා පෞද්ගලික අයදුම්කරුවන් වෙත දැනටමත් තැපැල් කර යවා ඇත.

මෙම විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම සඳහා අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පිළියෙල කරන ලද සෙ.මී. 30 x සෙ.මී. 20 ප්‍රමාණයේ ඉල්ලුම් පත්‍ර **2019.01.16** දින හෝ ඊට පෙර ලැබෙන සේ **විභාග කොමසාරිස් ජනරාල්, ඇගයීම් (පාසල් විභාග) ශාඛාව, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ ඉහළ, වම් කෙළවරෙහි **''ප්‍රතිඵල නැවත සමීක්ෂණය - අ.පො.ස. (උ.පෙළ) විභාගය 2018''** යන්න සඳහන් කළ යුතු ය.

ප්‍රතිඵල නැවත සමීක්ෂණයේදී අදාළ පිළිතුරු පත්‍ර සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් කිහිප දෙනෙකු යටතේ සම්පූර්ණයෙන් ම පරීක්ෂාවට ලක් කරනු ලැබේ. නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස z ලකුණෙහි හෝ ලැබී ඇති ශ්‍රේණියේ වැඩිවීමක් හෝ අඩුවීමක් හෝ සිදුවිය හැකි බව අපේක්ෂකයින් විසින් දැනගත යුතු බව අවධාරණය කරමි.

**ඉල්ලුම් පත් පිළියෙල කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු ය.**

01. පාසල් අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර අදාළ විදුහල්පති මගින් ද, පෞද්ගලික අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර තමා විසින්ම ද ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
02. ඉල්ලුම් පත්‍ර, ආදර්ශ ආකෘතිය අනුව ම පිළියෙල කළ යුතු ය.
03. එක් විෂයයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 250/= කි. තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට නියමිත ගාස්තුව ගෙවා කුවිතාන්සියක් ලබා ගෙන එය ඉල්ලුම් පත්‍රයෙහි **පසු පිටෙහි නොගැළවෙන සේ හොඳින් අලවා එවිය යුතු ය.** මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සියේ අංකය ද, ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද අයදුම්කරු ළඟ තබා ගත යුතු ය. (හැකිනම් මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වඩාත් යෝග්‍ය වේ.)
04. මුද්දර, චෙක්පත්, මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.
05. එක් විෂයයකට එක් ඉල්ලුම් පත්‍රය බැගින් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු ය.
06. ප්‍රතිඵල ලේඛනයේ දක්වා ඇති පරිදි විභාග අංකය, විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම, විෂය අංකය හා විෂයය, ලැබූ ශ්‍රේණිය සහ මාධ්‍යය නිවැරදිව ලිවිය යුතු ය. උපදෙස් හොඳින් කියවා ඉල්ලුම් පත්‍රය නිවැරදිව සම්පූර්ණ කිරීම ඉල්ලුම්කරුගේ වගකීම වේ. **මේ සමග ඇති විෂය ලේඛනය අනුව 01 (i) හි විෂය අංකය හා විෂයය ගැළපීම නිවැරදි විය යුතු ය.**
07. අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර, 2019.01.16 දිනට පසුව එවන ඉල්ලුම් පත්‍ර හා අදාළ ගාස්තුව ගෙවා නොමැති ඉල්ලුම් පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම් පත්‍ර සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
08. පෞද්ගලික අයදුම්කරුවන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයෙහි ඇතුළත් 01 සිට 07 දක්වා තොරතුරු පමණක් සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් වේ.
09. **විෂය අංක 12 - සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ලකුණු 30 කට වඩා අඩු වීම හේතුවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලැබූ අයදුම්කරුවන්ට එම විෂයය සඳහා ද නැවත සමීක්ෂණ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.**
10. මෙම දැන්වීම, ආදර්ශ ඉල්ලුම් පත්‍රය සහ විෂය ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ද **(www.doenets.lk)** පළ කර ඇත.

**සැ.යු. වැරදි තොරතුරු ඇතුළත් නැවත සමීක්ෂණ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

ඇගයීම් (පාසල් විභාග) ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ.
2018.12.29